**ඉමදූව ප්‍රාදේශීය සභාව**

**ගාල්ල දිස්ත්‍රික්කය**

-----------------------------

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2016 මාර්තු 31 දිනද ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2015 අප්‍රේල් 06 දිනද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2016 අගෝස්තු 31 දින සභාවේ ලේකම්වරයාට යවා ඇත.

### 1.2 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2015 දෙසැම්බර් 31 දිනට ඉමදූව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

පහත දැක්වෙන ගිණුම්කරණ අඩුපාඩු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යාංශයෙන් සභාවට ලැබී තිබුණු එකතුව රු.38,229,239 ක් වූ වාහන 6 ක වටිනාකම, බහුකාර්ය ජංගම කුටි 10 ක වටිනාකම සහ රු.498,150 ක් වූ ගැල්වනයිස් බට 450 හි වටිනාකම ගිණුම් ගතකර නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ සභික දීමනා රු.92,740 ක් අඩුවෙන්ද, උසාවි දඩ ආදායම රු.25,296 ක් වැඩියෙන්ද මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයට අදාළ රු.2,286,185 ක මුද්දර ගාස්තු ආදායම් ගිණුම් ගතකර නොතිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂයේදී රු.754,280 ක් ප්‍රාග්ධන වියදම් පුනරාවර්තන වියදම් යටතේ දක්වා තිබුණු අතර, රු.744,380 ක ස්ථාවර වත්කම් සහ ඉඩම් වෙන්දේසිවලින් සභාවට ලැබී තිබුණු ඉඩම් කැබලි 03 ක වටිනාකම ප්‍රාග්ධනිත කර නොතිබුණි.

#### 1.3.2 නොසැසඳූ පාලන ගිණුම්

එකතුව රු.7,399,024 ක් වූ ගිණුම් විෂයයන් 05 කට අදාළ ශේෂයන් සහ ඒවාට අදාළ උපයෝගී ලේඛන හා වාර්තාවල දැක්වෙන ශේෂයන් අතර එකතුව රු.158,106 ක් වූ අසමානතා විය.

### 1.3.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(i) නොවෙනස්ව ගිණුම් වල ඉදිරියට ගෙනෙමින් පවතින එකතුව රු.162,850 ක් වූ ලැබිය යුතු ගිණුම් ශේෂ 03 ක්, 2011 වර්ෂයේ සිට පවතින රු.38,475 ක් වූ ලැබිය යුතු ගිණුම් ශේෂයක් සහ සමාලෝචිත වර්ෂය අවසානයට එකතුව රු.42,792,127 ක් වූ ණයගැති ශේෂ පැවතිය ද ඒවා නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ii) 2010 වර්ෂයට පෙර සිට මූල්‍ය ප්‍රකාශනවල නොවෙනස්ව ඉදිරියට ගෙනෙමින් පවතින රු.9,520 ක් වූ ගෙවිය යුතු ගිණුම් ශේෂය සහ සමාලෝචිත වර්ෂය අවසානයට එකතුව රු.46,224,497 ක් වූ කර්මාන්ත ගිණුමේ ශේෂය මෙන්ම රු.1,457,799 ක් වූ විවිධ ණයහිමි ගිණුමේ ශේෂය නිරවුල් කිරීමට පියවර ගෙන නොතිබුණි.

### 1.3.4 විගණනය සඳහා සාක්ෂි නොවීම

එකතුව රු. 35,511,361 ක් වූ ඉඩම් හා ගොඩනැගිලි, යන්ත්‍ර හා උපකරණ, මෝටර් රථ හා කරත්ත, ලී බඩු හා සවි කිරීම් සහ පුස්තකාල පොත් සම්බන්ධයෙන්, යාවත්කාලීන කරන ලද වත්කම් පන්ති අනුව පිළියෙල කරන ලද ස්ථාවර වත්කම් ලේඛනය සහ උපලේඛනද, එකතුව රු. 101,579,234 ක් වූ ණයගැති සහ ණයහිමි ශේෂ සම්බන්ධයෙන් ණයහිමි හා ණයගැති ලේඛන, කාල විශ්ලේෂණ සහ ශේෂ සනාථ ද, එකතුව රු.6,666,091 ක් වූ සේවක ණය සහ විවිධ තැන්පතු සම්බන්ධයෙන් කාල විශ්ලේෂණ වාර්තා සහ යාවත්කාලීන කරන ලද තැන්පත් ලේඛනයද යනාදී සාක්ෂි ඉදිරිපත් නොකිරීම නිසා විගණනයේ දී ඒවා සතුටුදායක ලෙස පරීක්ෂා කිරීමට නොහැකි විය.

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

විගණනයට ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදමට වඩා අඩු වූ ආදායම රු.1,254,889 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදමට වඩා අඩු වූ ආදායම රු.3,111,522 ක් විය. ඉකුත් වර්ෂය සමඟ සැසඳීමේ දී සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයේ රු.1,856,633 ක වර්ධනයක් පෙන්නුම් කෙරුණි.

### 2.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

(අ) ඉකුත් වර්ෂය සමඟ සැසඳීමේ දී සමාලෝචිත වර්ෂයේ පුනරාවර්තන ආදායම් ඉක්මවා රු.1,254,889 ක පුනරාවර්තන වියදම් පැවතීම නිසා සභාවේ ආදායමට සාපේක්ෂව වියදම ඉතා ඉහළ මට්ටමක පැවතින.

(ආ) සමාලෝචිත වර්ෂය සහ ඉකුත් වර්ෂ දෙක තුළ ආදායම් ආධාර, ස්වයං උත්පාදන ආදායම් සහ පුනරාවර්තන වියදම් පිළිබඳ සාරාංශගත විස්තරයක් පහත දැක්වේ.

| වර්ෂය | මුළු පුනරාවර්තන ආදායම් | ආදායම් ආධාර මුදල් | ස්වයං උත්පාදන ආදායම් | මුළු පුනරාවර්තන වියදම් | ස්වයං උත්පාදන ආදායම් ඉක්මවා ගිය පුනරාවර්තන වියදම |
|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. | රු. |
| 2015 | 38,888,951 | 26,046,376 | 12,842,575 | 40,143,840 | 27,301,265 |
| 2014 | 24,707,003 | 14,862,248 | 9,844,755 | 27,818,525 | 17,973,770 |
| 2013 | 23,104,576 | 12,226,270 | 10,878,306 | 21,893,082 | 11,014,776 |

මේ සම්බන්ධයෙන් පහත දැක්වෙන නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) 2013 වර්ෂයේ දී ස්වයං උත්පාදන ආදායම මෙන් දෙගුණයකින් ද, 2014 සහ 2015 යන වර්ෂ වලදී තුන් ගුණයකින් ද සභාවේ පුනරාවර්තන වියදම් වැඩි වී තිබුණද, එම තත්ත්වය හඳුනාගෙන ආදායම් වැඩි දියුණු කර ගැනීම කෙරෙහි සභාවේ අවධානය යොමු වී නොතිබුණි.

(ii) ආදායම් ආධාර නොලැබෙන්නට සභාවේ ආදායම් වලින් පුනරාවර්තන වියදම් ආවරණය කර ගැනීමට නොහැකි බව පෙන්නුම් කළ ද, වියදම් අවම කර ගැනීම කෙරෙහි සභාවේ අවධානය යොමු වී නොතිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේ ප්‍රාග්ධන ආදායම ඉක්මවා රු.1,627,173 ක ප්‍රාග්ධන වියදම් දරා තිබූ අතර, අයවැය ලේඛනය අනුව ප්‍රාග්ධන ආදායම ඉක්මවන රු.5,555,000 ක ප්‍රාග්ධන වියදම් සඳහා අරමුදල් සපයා ගන්නා ආකාරය පිළිබඳව පැහැදිලි කර නොතිබුණි.

## 2.3 ආදායම් පරිපාලනය

### 2.3.1 වරිපනම් බදු

සමාලෝචිත වර්ෂය සහ ඉකුත් වර්ෂවලට අදාළව අයකර ගත යුතුව තිබුණු රු.393,249 ක් වූ වරිපනම් බදු මුදලින් සියයට 21 ක් පමණක් අය කර ගෙන තිබුණි. 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 158(1)(අ) ඡේදය පරිදි හිඟ මුදල් අයකර ගැනීම කෙරෙහි සභාවේ අවධානය යොමු වී නොතිබුණි.

### 2.3.2 අක්කර බදු

සමාලෝචිත වර්ෂය අවසානයට රු.56,608 ක් අය කරගත යුතුව තිබුණ ද, වර්ෂය තුළ අය කරගෙන තිබුණේ රු.762 ක් තරම් අවම අගයකි. 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 158(1)(අ) ඡේදය පරිදි හිඟ බදු මුදල් අයකර ගැනීම කෙරෙහි සභාවේ අවධානය යොමු වී නොතිබුණි.

**2.3.3 කසළ බදු**

**-----------**

සමාලෝචිත වර්ෂය සඳහා ඇස්තමේන්තු කර තිබුණු රු.300,000 ක කසළ බදු වලින් රු.191,650 ක් අයකරගෙන තිබුණි. එය අපේක්ෂිත ආදායමින් සියයට 64 ක අගයක් විය. හිඟ බදු අයකර ගැනීම සඳහා විධිමත් වැඩපිළිවෙලක් සකස් කර ක්‍රියාත්මක කර නොතිබුණි.

**2.3.4 බලපත්‍ර ගාස්තු සහ ව්‍යාපාර බදු**

----------------------------------

සමාලෝචිත වර්ෂය සඳහා අයකර ගත යුතු රු.280,666 ක බලපත්‍ර ගාස්තු සහ රු.852,950 ක් වූ ව්‍යාපාර බදු වලින් වර්ෂය තුළ රු.593,800 ක් අයකරගෙන තිබුණි. හිඟ මුදල් අයකර ගැනීම සඳහා 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 152(4) වගන්තිය ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

**2.3.5 උසාවි දඩ හා මුද්දර ගාස්තු**

----------------------------

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් 2015 දෙසැම්බර් 31 දිනට උසාවි දඩ වෙනුවෙන් රු.372,261 ක් හා මුද්දර ගාස්තු වෙනුවෙන් රු.9,600,000 ක් ලැබිය යුතුව තිබුණි.

**3. මෙහෙයුම් සමාලෝචනය**

**----------------------------**

**3.1 කාර්ය සාධන ඇගයීම**

**------------------------**

සමාලෝචිත වර්ෂයේ අයවැය ලේඛනයේ දක්වා ඇති ඇස්තමේන්තුගත ප්‍රාග්ධන වියදම් හා තථ්‍ය ප්‍රාග්ධන වියදම් සැසඳීමේ දී, සභාවේ එක් එක් අරමුණු ඉටුකර ගැනීම සඳහා සලසා තිබුණු ප්‍රතිපාදන, එකී අරමුණු ඉටුකර ගැනීම සඳහා යොදවා ගැනීමේ පසුගාමී තත්ත්වයක් පෙන්නුම් කෙරෙන අතර, එය සභාවට මෙන්ම සභා බලප්‍රදේශයේ ජනතාවට සිදු වූ පාඩුවක් ලෙස විගණනයේ දී නිරීක්ෂණය විය.

**3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා**

**------------------------------------**

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) සේවක සංඛ්‍යා සැලැස්මේ අනුමත වූ කාර්ය මණ්ඩලය ඉක්මවා 26 දෙනෙකු ද, අනුමත නොවූ තනතුරු වල 10 දෙනෙකු ද වශයෙන් අතිරික්ත සේවක සංඛ්‍යාව 36 ක් විය. කෙසේ වුවද, අතිරික්ත කාර්ය මණ්ඩලය විධිමත් කර ගැනීම කෙරෙහි සභාවේ අවධානය යොමු වී නොතිබුණි.

(ආ) වර්ෂ 01 සිට වර්ෂ 08 දක්වා කාලයක සිට අයවීම් හිඟහිට පවතින සේවකයින් 12 දෙනෙකුගෙන් අයවිය යුතු එකතුව රු.52,698 ක් වූ ණය ශේෂ අයකර ගැනීම සම්බන්ධයෙන් ශ්‍රී ලංකා ජනරජයේ ආයතන සංග්‍රහයේ xxiv වැනි පරිච්ඡේදයේ 04 වගන්තිය ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

(ඈ) 2006 අප්‍රේල් 15 දින වත්කම් හා බැරකම් බෙදාදීමේ කමිටුවේ නිර්දේශය මත හබරාදුව ප්‍රාදේශීය සභාව විසින් ඉමදුව ප්‍රාදේශීය සභාවට පැවරිය යුතු බවට තීරණය කර තිබූ රු.9,794,393 ක වත්කම් හා රු.2,051,704 ක බැරකම් පාදක කරගෙන ගිණුම් පිළියෙල කර තිබුණ ද, 2016 මැයි 18 දින වනවිටත් අදාළ වත්කම් හා බැරකම් නීත්‍යානුකූලව සභාව වෙත පවරාගෙන නොතිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂය සඳහා රු.780,000 වාර්ෂික බදු මුදලක් මත බෝගහගොඩ සඳුදා සතිපොල බදුදීම සඳහා සභාව විසින් එළඹී තිබුණු බදු ගිවිසුම ප්‍රකාරව සභාව විසින් රු.148,000 ක අධි ගාස්තු අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

### 3.3 බෝගහගොඩ සතිපොල ඉදිකිරීම සඳහා වූ ඉඩම් පවරා ගැනීම

-----------------------------------------------------------------

පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) බෝගහගොඩ සතිපොල ඉදිකිරීම සඳහා ඉඩම් පවරා ගැනීමට යෝජිත කුඹුරු ඉඩම රු.2,850,000 කට තක්සේරු දෙපාර්තමේන්තුව විසින් තක්සේරු කර තිබූ අතර, ඒ අනුව ඉඩම් අත්පත් කර ගැනීම වෙනුවෙන් දේශීය ණය හා සංවර්ධන අරමුදලින් රු.2,280,000 ක් හා සභාවේ මුදලින් රු.570,000 ක් වශයෙන් රු.2,850,000 ක මුදලක් 2014 ඔක්තෝබර් 20 දින ඉමදුව ප්‍රාදේශීය ලේකම් වෙත තැන්පත් කර තිබුණද ඊට අදාළ ක්‍රියාමාර්ග නොගැනීම නිසා එම මුදල් නිශ්ක්‍රීයව පැවතුණි.

(ආ) එහෙත් ණය මුදල ලබාගත් දින සිට මසකට සියයට 6.5 ක පොලී ප්‍රතිශතයක් යටතේ දේශීය ණය සහ සංවර්ධන අරමුදලට 2015 දෙසැම්බර් 31 දිනට රු.178,590 ක පොලී මුදලක් ගෙවා තිබුණි.

### 3.4 කොන්ත්‍රාත් පරිපාලනය

--------------------------

ඉමදුව වෙළඳ සංකීර්ණය, ඉදිරි අංගනය සහ ප්‍රජා ශාලාව ඉදිකිරීම සම්බන්ධව පහත දැක්වෙන නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) මෙම ඉදිකිරීමට අදාළ කොන්ත්‍රාත්තුව 2007 දෙසැම්බර් 17 දින පුද්ගලික තැනැත්තෙකුට රු.22,156,800 කට ප්‍රදානය කර තිබූ අතර, 2008 සැප්තැම්බර් 12 දින වන විට කර්මාන්තයේ වැඩ අවසන් කළ යුතුව තිබුණි. 2015 නොවැම්බර් 11 දින වන විටත් බිම් මහලෙහි කඩ කාමර 12 ක් පමණක් ඉදිකර තිබූ අතර, ඒ සඳහා එකතුව රු.11,654,060 ක මුදලක් කොන්ත්‍රාත්කරුට ගෙවා තිබුණි. එමෙන්ම කඩ කාමර 20 ක් වෙනුවෙන් 2008 වර්ෂය තුළදී රු.7,641,525 ක එක්වන් මුදලක් බදුකරුවන්ගෙන් සභාව විසින් ලබාගෙන තිබූ බවද නිරීක්ෂණය විය.

(ආ) නැවතත් කඩ කාමර වැඩිදියුණු කිරීම සහ ඉදිරි අංගනය හා ප්‍රජා ශාලාව ඉදිකිරීම සඳහා පුරනැගුම ව්‍යාපෘතිය සමඟ ගිවිසුම්ගතව තිබූ අතර, ඒ අනුව 2014 අප්‍රේල් 22 දින කොන්ත්‍රාත්කරුට රු.6,452,393 ක අත්තිකාරම් මුදලක් ගෙවා තිබුණි. එහෙත් ඉඩමෙහි පැවති නාය යාමේ තත්ත්වය මත 2014 දෙසැම්බර් 31 දින ඉදිකිරීම් කටයුතු නවතා දමා තිබූ අතර, ඒ අනුව කොන්ත්‍රාත්කරු විසින් ඉටු කළ වැඩ වෙනුවෙන් රු.3,914,260 ක ඉටු කළ වැඩ වාර්තාවක් ඉදිරිපත් කර තිබුණි. ඒ අනුව අත්තිකාරම් මුදල හා වැඩ

වාර්තාව අතර වූ වෙනස රු.2,538,125 ක මුදල කොන්ත්‍රාත්කරුගෙන් අය කරගෙන කොන්ත්‍රාත්තුව අවසන් කර තිබුණි.

(ඇ) ඒ අනුව ඉඩමේ ස්ථායිතාව පිළිබඳ වාර්තා ලබා නොගෙන, ශක්‍යතා අධ්‍යයනයක් සිදු නොකර, ගෙවා තිබුණු එකතුව රු.15,568,328 ක වියදම ඵලදායී නොවන වියදමක් බව විගණනයේ දී නිරීක්ෂණය විය.

## 3.5 ඝන අපද්‍රව්‍ය කළමනාකරණය

සභාවේ කසල කළමනාකරණය සම්බන්ධයෙන් 2015 නොවැම්බර් 13 දින සිදු කරන ලද පරීක්ෂාවේ දී කසල එකතු කිරීම සඳහා සභා බලප්‍රදේශයේ ඉඩමක් තෝරා ගෙන ඒ වෙනුවෙන් ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කිරීම කෙරෙහි සභාවේ අවධානය යොමු වී නොතිබුණි.

## 4. යහපාලනය හා ගිණුම් කටයුතුභාවය

## 4.1 අයවැය පාලනය

සමාලෝචිත වර්ෂය සඳහා වූ අයවැය ලේඛනයේ ඇතුළත් වියදම් විෂයයක රු.1,122,859 ක් වූ සම්පූර්ණ ප්‍රතිපාදනයද, තවත් වියදම් විෂයයන් 05 ක එකතුව රු.13,773,184 ක් වූ ඉතිරිවීම්ද, වෙනත් වියදම් විෂයයන් 02 ක සීමාවන් ඉක්මවා රු.10,327,631 ක් වියදම්ද, ප්‍රතිපාදන සලසා නොතිබුණු වියදම් විෂයයක් යටතේ රු.252,490 ක් වැය කිරීම්ද, ආදායම් විෂයයන් 05 ක ලඟාකර නොගත් ඉලක්කගත ආදායම් රු.14,512,692 ක් පැවතීම නිසා අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදා ගෙන නොතිබුණි.

## 4.2 අභ්‍යන්තර විගණනය

පළාත් පාලන කොමසාරිස් (දකුණු පළාත) ගේ 2014 පෙබරවාරි 24 දිනැති අංක දපපා/යහ/01/න.ව.ලේ දරන චක්‍රලේඛය ප්‍රකාරව අභ්‍යන්තර විගණනයක් සිදුකර නොතිබුණු නමුත්, සභාව විසින් පත්කර තිබුණු විගණන නිලධාරියාට සමාලෝචිත වර්ෂයේ දී වැටුප් හා දීමනා ලෙස රු.422,831 ක් ගෙවා තිබුණි.

## 4.3 විගණන හා කළමනාකරණ කමිටු

2009 ජුනි 09 දිනැති කළමනාකරණ විගණන චක්‍රලේඛ අංක DMA/2009(i) හි දැක්වෙන විධිවිධාන ප්‍රකාරව විගණන හා කළමනාකරණ කමිටු පිහිටුවීමට සමාලෝචිත වර්ෂයේදීත් කටයුතු කර නොතිබුණි.

**4.4 වත්කම් කළමනාකරණය**

---------------------------

**(අ) නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්**

----------------------------------------

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(i) සභාව විසින් නැණසලක් ඉදිකිරීම වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේ දී රු.18,520 ක වියදම් දරා විදුලි උපාංග මිලදී ගෙන සවිකිරීම් කර තිබුණු නමුත්, නැණසලක් පවත්වා නොතිබුණි.

(ii) ප්‍රධාන කාර්යාල හා උප කාර්යාල පරිශ්‍ර තුළ පිරිවැය රු.1,959,000 ක් වූ වාහන 03 ක් නිශ්ක්‍රීයව අනාරක්ෂිතව ගාල්කර තිබුණි.

**(ආ) පවරා නොගත් වත්කම්**

--------------------------

2011 අගෝස්තු 04 දිනැති ලිපිය මඟින් ආදාහනාගාරයක් ඉදිකිරීම සඳහා ලබා දී තිබු පුද්ගලික සමාගමකට අයත් අක්කර 10 ක ඉඩමක් සහ ඉඩම් වෙන්දේසි වලින් ලැබී තිබුණ ඉඩම් කැබැලි 03 ක් සභාව විසින් නීත්‍යානුකූලව පවරා ගැනීමට සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් කටයුතු කර නොතිබුණි.

**5. පද්ධති හා පාලනය**

--------------------

පහත විස්තර දැක්වෙන පද්ධති හා පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය
(ආ) අයවැය පාලනය
(ඇ) ආදායම් පරිපාලනය
(ඈ) වත්කම් කළමනාකරණය
(ඉ) කොන්ත්‍රාත් පාලනය
(ඊ) මානව සම්පත් කළමනාකරණය
(උ) වාහන පාලනය